සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**6 ශ්‍රේණිය** | **පෙරදිග සංගීතය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

# I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 සරිග, රිගම, .......... මෙම ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදෙන ස්වර ඛණ්ඩය වන්නේ කුමක් ද?
(1) ගරිස (2) මගරි (3) ගමප (4) පමග

02 පහත සඳහන් ගීත අතරින් ළමා ගීතයක් වන්නේ කුමක් ද?
(1) ආදරේ ඇයි පොඩි හඳ මාමේ (2) අද වෙස්සන්තර රාජ පුතා
(3) මෙම ගිම්හාන ග්‍රීස්ම වූ කාලේ (4) සුවඳ පද්ම ඕලු ආදි

03 ජාතික ගීතයේ නිර්මාතෘවරයා වන්නේ,
(1) ඩබ්ලිව්.ඩී. අමරදේව මහතා ය. (2) ඩබ්ලිව්.බී. මකුලොලුව මහතා ය.
(3) ආනන්ද සමරකෝන් මහතා ය. (4) වික්ටර් රත්නායක මහතා ය.

04 ''හොඳ දේ සිතමි සිතු දේ කියමි'' මෙම ගීතය ඇතුළත් ගීත වර්ගය වන්නේ කුමක් ද?
(1) ස්වර ස්ථාපන ගීත (2) ළමා ගීත (3) නූර්ති ගීත (4) කෙළි ගීත

05 පාසලක අභිමානය විදහා දක්වන්නේ,
(1) ස්වර ස්ථාපන ගීතයෙනි. (2) ජාතික ගීයෙනි.
(3) පාසල් ගීයෙනි. (4) ළමා ගීතයෙනි.

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති හිස්තැන් පුරවන්න.**

06 ගායනයේ දී හුස්ම පාලනය කර ගැනීම සඳහා ............................................ අභ්‍යාස පුහුණු කිරීම වැදගත් ය.

07 ස්වර සප්තකයේ පස්වන ස්වරය ............................................ යි.

08 සංගීතයේ මාධ්‍ය වන්නේ ............................................ යි.

09 පෙරදිග සංගීතයේ 'ස' ස්වරය බටහිර සංගීතයේ දී ............................................ ලෙස ගායනය කරනු ලබයි.

10 වර්ණ, රේඛා, හැඩතල මාධ්‍යයක් ලෙස භාවිත වන කලාව ............................................ වේ.

- **අංක 11 - 15 දක්වා A කොටසේ දී ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11 | ප්‍රධාන තත් 7 කින් යුතු වාද්‍ය භාණ්ඩයකි | සර්පිනාව |
| 12 | ස්වර පුවරුව සහිත වාද්‍ය භාණ්ඩයකි | තබ්ලාව |
| 13 | පිඹීමෙන් නාදය නිපදවන සංගීත භාණ්ඩයකි. | සිතාරය |
| 14 | තත් 4 කින් යුතු ස්වර වාද්‍ය භාණ්ඩයකි. | බටනලාව |
| 15 | තාල වාද්‍ය භාණ්යකි. | වයලීනය |

- **අංක 16 - 20 දක්වා ඇති ප්‍රශ්නවලට හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

16 ''අහසට පිඹිනා එරන් කළේයා'' මෙම ගීතය කළගෙඩි සෙල්ලමට අයත් ගීතයකි. ( )

17 මවුත් ඕගනය විද්‍යුත් සංගීත භාණ්ඩයකි. ( )

18 ''කඳු පළෙ අතරේ තුරු වදුලේ'' ගීතය ශුද්ධ ස්වර සප්තකයම ඇතුළත් ස්වස්ථාපන ගීයකි. ( )

19 ''මේවර කෙළිය'' දෙපිළකට බෙදී ගායනය කරනු ලබන ජන ක්‍රීඩාවකි. ( )

20 සිංහල ජන ක්‍රීඩා ආශ්‍රිත ගායනා තුළින් සතුට විනෝදය මෙන්ම එකමුතුකම හා සහජීවනය පිළිබඳව ද කියවේ. ( )

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01 නිර්දේශිත ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක ගීත ස්වර ප්‍රස්තාරය ලියා දක්වන්න. (ල. 10)

02 (i) ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ 02 ක් හා තත් වාද්‍ය භාණ්ඩ 02 ක් නම් කරන්න. (ල. 04)

(ii) ස්වර පුවරුවක දළ රූප සටහනක් ඇඳ එහි ශුද්ධ ස්වර අෂ්ටකය ලකුණු කරන්න. (ල. 06)

03 (i) සිංහල ජන ක්‍රීඩා හා බැඳුණු ගී වර්ග 04 ක් නම් කරන්න. (ල. 04)

(ii) ඉහත නම් කළ ගීත දෙකෙන් එකකට අයත් එක් කවියක් ලියා දක්වන්න. (ල. 06)

04 (i) නූර්ති නාට්‍ය 02 ක් නම් කර නූර්ති ගී ගායනයේ දී වාදනය සඳහා යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ 02 ක් නම් කරන්න. (ල. 04)

(ii) නූර්ති ගීතයක පදමාලාවෙහි මුල් කොටස් දෙකක් ලියා දක්වන්න. (ල. 06)

05 (i) ජනප්‍රිය ළමා ගීත හතරක් නම් කරන්න. (ල. 04)

(ii) ළමා ගීතයක පදමාලාවේ මුල් කොටස් දෙකක් ලියා දක්වන්න. (ල. 06)

(ලකුණු 3 x 10 = 30)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

6 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

## ප්‍රායෝගික පරීක්ෂණය

01 ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් ගායනය හෝ වාදනය. (ලකුණු 10)

02 පාසල් ගීතය හෝ ජාතික ගීතය අතරින් කැමති ගීතයක් ගායනය හෝ වාදනය. (ලකුණු 10)

03 අද වෙස්සන්තර, මෙම ගිම්හාන, සුවඳ පද්ම යන නූර්ති ගී අතරින් කැමති ගීතයක් ගායනය හෝ වාදනය (ලකුණු 10)

04 එළුවන් කෑම, මේවර කෙළිය, ඔළිඳ කෙළිය, කළගෙඩි සෙල්ලම යන කෙළි ගී අතරින් කැමති ගීතයක් ගායනය. (ලකුණු 10)

05 ස්වර පුවරු සංගීත භාණ්ඩයකින් ශුද්ධ ස්වර අෂ්ටකය ආරෝහණ අවරෝහණ නිවැරදි ඇඟිලි හසුරවමින් වාදනය. (ලකුණු 10)

(මුළු ලකුණු 50)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 02 | 1 | 03 | 3 | 04 | 1 | 05 | 3 | 06 | ස්වසන | 07 | පංචමය |
| 08 | නාදය / ස්වර | | | 09 | Do, ඩෝ, දෝ | | | 10 | චිත්‍ර | | | 11 | සිතාරය |
| 12 | සර්පිනාව | | | 13 | බටනලාව | | | 14 | වයලීනය | | | 15 | තබ්ලාව |
| 16 | ✓ | 17 | × | 18 | × | 19 | ✓ | 20 | ✓ | | | | |

(1 x 20 = 20)

## II කොටස

01 නිර්දේශිත ශුද්ධ ස්වර ස්ථාපන ගීයක් ගීත ස්වර ප්‍රස්තාර කර තිබීම. (වචන වලට ල.04 / ස්වර වලට ල. 06) (ල.10)

02 (i) ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ 02 ක් නම් කිරීම හා තත් වාද්‍ය භාණ්ඩ 02 ක් නම් කිරීමට. (ල.04)

(ii)
- ස්වර පුවරුවේ දළ සටහන ඇඳ තිබීමට. (ල.02)
- ස්වර අෂ්ටකය නිවැරදිව ලකුණු කිරීමට. (ල.04)

03 (i) එළුවන් කෑම, ඔළිඳ කෙළිය, මේවර කෙළිය, කළ ගෙඩි සෙල්ලම වැනි ගී වර්ග 04 ක් ලියා ඇති විට (ල. 04)

(ii) කෙළි ගීයක පද මාලාව ලිවීමට (ල. 06)

04 (i) නූර්ති නාට්‍ය 02 ක් නම් කිරීමට (ල.02)

වාද්‍ය භාණ්ඩ 02 ක් නම් කිරීමට (ල.02)

(ii) කැමති නූර්ති ගීයක් මුල් කොටස් 02 ලියා ඇතිවිට. (ල.06)

05 (i) ජනප්‍රිය ළමා ගී හතරක් නම් කිරීමට (ල.04)

(ii) ගීතයේ මුල් කොටස නිවැරදිව ලියා ඇතිවිට (ල.06)